# යෝගාචාර සම්ප්‍රදායාගත පංච මාර්ග සංකල්පයෙහි නිෂ්ඨා මාර්ගය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**වලවේ තුසිතසිරි හිමි**[1]

## හැඳින්වීම

යෝගාචාර සම්ප්‍රදායාගත චතුරාර්ය සත්‍යයෙහි හතරවන මාර්ග සත්‍යය සංකල්පයේ එන පංච මාර්ග සංකල්පයෙහි පස්වන මාර්ගය, නිෂ්ඨා මාර්ගය යි. නිෂ්ඨා යන පදයෙන් තිරබව, පදනම, විශ්වාසය, කෙළවර, මරණය ආදී අර්ථ ගම්‍ය වන හෙයින් මෙය අවසාන මාර්ගය, කෙළවර කිරීමේ මාර්ගය හෝ නිමා කිරීමේ මාර්ගය ලෙස අර්ථ විවරණය කළ හැකි ය. මෙම මාර්ගයේ දී නිමා කරණුයේ කුමක් ද යත් පළමු සම්භාර මාර්ගයේ දී වීර්ය හා අභ්‍යාස ආරම්භ කරන ලද ආර්ය මාර්ගය යි. එහෙයින් ආර්ය මාර්ගය පූරණය කිරීම සඳහා බෝධිසත්ත්වයන්ට මෙම මාර්ගයෙන් වන බලපෑම කවරාකාර වූවක් ද යන්න හා මෙම මාර්ගයෙහි ස්වරූපය පිළිබඳ ව මෙහි දී අධ්‍යයනය කරනු ලබයි. පොදුවේ මහායාන සම්ප්‍රදාය විසින් ද මෙම පංච මාර්ග ප්‍රතිපාදව අනුමග මනය කරන හෙයින් මහායානයෙහි වන ශාඛාවක් ලෙස යොගාචාරය විසින් පංච මාර්ගය සහ නිෂ්ඨා මාර්ගය මගින් තම සම්ප්‍රදායේ අනන්‍යතාව ප්‍රකට කරන ආකාරය සහ පොදු මහායාන රාමුව වෙත යෝගාචාරීන් විසින් සිදුකරන බලපෑම යන පර්යේෂණ ඌනතාව මෙහි දී විමර්ශනය කෙරෙණි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය, ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය පාදක කොට සිදු කරනු ලැබූවකි. මූලාශ්‍රය අධ්‍යයනය මූලික කොට ඒ යටතේ ප්‍රාථමික මූලාශ්‍රය, ද්විතීක මූලාශ්‍රය අධ්‍යයනය කරනු ලැබීය. ප්‍රාථමික මූලාශ්‍රය යටතේ මහායාන බෞද්ධ සංස්කෘත සූත්‍ර මෙන් ම අට්ඨකතා, ටීකා, කාරිකා සහ භාෂ්‍ය ග්‍රන්ථ අධ්‍යයනය කරන ලදි. ද්විතීක මූලාශ්‍රය ලෙස කෝෂ ග්‍රන්ථ යටතේ ශබ්ද කෝෂ හා විශ්ව කෝෂ, ශාස්ත්‍රීය සඟරා ද මහායානා බෞද්ධ දර්ශනය විෂය ක්ෂේත්‍ර මෙන් ම සමය අධ්‍යයනය විෂය ක්ෂේත්‍රයට අයත් විද්වතුන් විසින් රචනා කරන ලද පර්යේෂණ සහ ශාස්ත්‍රීය ග්‍රන්ථ ද අධ්‍යයනය කරනු ලැබීය. පර්යේෂණ දත්ත ලබා ගැනීම සඳහා දත්ත සම්පාදන කාර්යයෙහි ද්විතීක දත්ත සම්පාදනය යටතේ අභ්‍යන්තර දත්ත මෙන් ම බාහිර දත්ත රැස් කෙරෙනි. ඒ අනුව අභ්‍යයන්තර දත්ත යටතේ භාවිතය සඳහා සූදානම් කරන ලද හා සකස් කළ දත්ත ගොනු යොදා ගත් අතර ඒ සඳහා පුස්තකාල අධ්‍යයනය මගින් දත්ත සම්පාදනය කරන ලදි. බාහිර දත්ත යටතේ ප්‍රකාශිත ද්‍රව්‍ය හා පරිගණක දත්ත ගබඩා සහ අන්තර්ජාල මූලාශ්‍රය භාවිත කළහ.

1. පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
wthusithasiri23@gmail.com

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

වසුබන්ධපාදයන් මුල් කාලීනව සාර්වාස්තිවාද සම්ප්‍රදාය අනුගමනය කළ වූවෙකු වන හෙයින් එම සම්ප්‍රදායෙන් ලද ආභාෂය මත යෝගාචර සම්ප්‍රදාය තුළ පංච මාර්ගය සංකල්පයට අදාළ ඉගැන්වීම් සකස්වන්නට ඇතැයි සැළකේ. සම්භාර මාර්ගය, ප්‍රයෝග මාර්ගය, දර්ශන මාර්ගය, භාවනා මාර්ගය සහ නිෂ්ඨා මාර්ගය වශයෙන් දක්වන එම පංච මාර්ගය තුළින් ආර්ය මාර්ගයට පිළිපන් බෝධිසත්ත්වයන් විසින් තම අධ්‍යාත්මික ගමන් මඟ සකස් කරගත යුතු ආකාරය දක්වා තිබේ. මෙහි නිෂ්ඨා මාර්ගය යනු පස්වන හෙවත් අවසාන මාර්ගය වන අතර පළමු සම්භාර මාර්ගයේ දී බෝධිසත්ත්ව අභිලාෂ, කුසල් සහ ප්‍රඥා වර්ධනය කරමින් දෙවන ප්‍රයෝග මාර්ගයට ඇතුළත් ව ඌෂ්මාණ, මූර්ධාන, සත්‍යානුකූල ක්ෂාන්ති, ලෞකිකාග්‍ර ධර්ම අභ්‍යාස පූරණය කිරීමෙන් ලෞකිකත්වයේ සීමාව ඉක්මවා යෑමට බෝධිසත්ත්වයන් සමත් වේ. ඉන්පසු තෙවන දර්ශන මාර්ගයට පිළිපන් බෝධිසත්ත්වයන් විසින් යෝගාචාර පරමාර්ථ සත්‍යය වූ විඤ්ඤාණය පිළිබඳ ඍජු දැක්මක් ලබා ගනිමින් තථතා හෙවත් නිවන් අවබෝධය පිණිස දෛවයිත වූ ආවරණ ධර්මයන්ගේ ප්‍රහාණය කිරීමට උත්සාහවත් වෙයි. දර්ශන මාර්ගය අවසානයේ දී ලද අවබෝධය සිව්වන භාවනා මාර්ගයේ දී ස්ථාවර කරමින් අභ්‍යාස කිරීම මත ප්‍රස්තුත නිෂ්ඨා මාර්ගයට ප්‍රවේශ වීමට බෝධිසත්ත්වයන්ට අවස්ථාව හිමි වේ. සර්වාස්තිවාද සම්ප්‍රදායට අනුව මෙම මාර්ගයට ප්‍රවේශ වීමේ දී ආර්ය මාර්ග ගාමීන් අනාගාමී තත්වයට පත් ව ඇති අතර නිෂ්ඨා මාර්ගයේ අභ්‍යාස කරණය මත අර්හත් භාවයට පත්වන බව පෙන්වා දෙයි. නමුත් යෝගාචාරීන් පෙන්වා දෙන්නේ අර්හත්වයෙන් ක්ලේශාවරණ දුරු කිරීම සර්වඥතාව අවබෝධය සඳහා වන මාර්ගය නොවන බව යි. ඒ සඳහා ඥෙයයාවාරණයන්ගේ දුරු කිරීම ද සිදු කළ යුතු බව පෙන්වා දෙන යෝග ාචාර විඤ්ඤාණවාදීන් ප්‍රවෘත්ති විඤ්ඤාණයෙහි වූ ෂට් ඉන්ද්‍රියන් මගින් ලබා ගත් විෂය වස්තූන් මමායනය කිරීමෙන් හෙවත් ආත්ම ලෙස ගැනීම නිසා හත්වන මනන විඤ්ඤාණයෙහි ආත්ම දෘෂ්ටි, ආත්ම මෝහ, ආත්ම මාන සහ ආත්ම ස්නේහ ආදී අඳුරු ක්ලේශ ධර්මයෝ ජනනය කරමින් එහි තැම්පත් වනු ලබයි. මෙම ආත්මීය ධර්මයන්ගේ ක්‍රියාත්මක වීමෙන් ආලය විඤ්ඤාණය තුළ ක්ලේශ, කර්ම, විපාක ලෙසින් හඳුන්වන ආවරණ බීජ ධර්ම තැම්පත් වීම සිදු වන අතර එම මනන විඤ්ඤාණයෙහි ක්‍රියාත්මක වීම නිසාවෙන් ආලය විඤ්ඤාණයෙහි තැම්පත් මෙකී සර්ව බීජයාගේ මෙහෙය වීම මත ප්‍රවෘර්ති විඤ්ඤාණයෙහි ක්‍රියාත්මක වීම සිදු වේ. මේ නිසා ආලය විඤ්ඤාණයෙහි වන ඥෙයවාරණ හෙවත් සර්ව බීජ ධර්මයාගේ ප්‍රහාණය බෝධිසත්ත්වයන් විසින් මෙම මාර්ගයේ දී සිදු කළ යුතු ය. නිෂ්ඨා මාර්ගයෙහි අභ්‍යාසකරණයෙන් සිල්ල විඥපත්ති මාත්‍රතාවක් බවට වන අවබෝධය හෙවත් ධර්ම නෛරාත්මතාවය යම් අයෙකු විසින් අවබෝධ කරගන්නේ ද හෙතෙම බුදුරදුන්ගේ සැබෑ කාය වන ධර්මකාය අවබෝධ කරාන්නාහු වන බවත් ක්ලේෂාවරණ සහ ඥෙයයාවරණයෝ මුලිනුපුටා දමා 'ශ්‍රෝ වා අනාශ්‍රාව ධාතුව' වෙත පැමිණුනු නිසා ද ආලය විඤ්ඤාණයාගේ හඹා යෑම නවතා ලූ හෙවත් සංසාරය නවතා ලූ හෙයින් ද මෙය ධර්මකාය ලෙස නම් වන බව දැක් වේ. ධර්මකාය සාක්ෂාත්කරණය නම් පංච මාර්ගයෙහි අවසාන නිෂ්ඨා මාර්ගය පූරණය කිරීම යි. එහෙයින් ක්ලේෂාවරණ දුරු කිරීම ශ්‍රාවකයානිකයන්ගේ විමුක්ති මාර්ගය වන බවත් ඥෙයයවරණ දුරු කිරීම බෝධිසත්ත්වයානිකයන්ගේ විමුක්ති මාර්ගය වන බවත් මෙම දෛවයිත ආවරණයෝ ප්‍රහාණය කළාහු සර්වඥතාවයට පත් වන්නන් බවත් යෝගචාරය

විසින් පෙන්වා දෙයි. මෙකී සර්වඥතාවබෝධය හෙවත් බුද්ධත්ත්ව සාධනය සඳහා ශක්‍යතාව ඇත්තේ ඤෙයයාවාරණ දුරු කිරීමට සමත් වන බෝධිසත්ත්වයානිකයන්ට වන බව පෙන්වා දෙමින් බෝධිසත්ත්වයානය පොදු මහායාන රාමුව තුළ ස්ථාවර කිරීම සඳහා යෝගාචාරීන් විසින් ප්‍රමුඛ කාර්ය භාර්යක් ඉටු කරනු ලබයි.

**නිගමනය**

සියලු සත්ත්වයාගේ බුද්ධත්ත්ව සාධනය සඳහා තම බුද්ධත්ත්වය සාධනය කැපකරන බෝධිසත්ත්ව පරමාදර්ෂය මහායාන සම්ප්‍රදායේ ප්‍රමුඛ ඉගැන්වීමක් වේ. මහායාන ශාඛාවක් ලෙස යෝගාචාරීන් ද බෝධිසත්ත්ව ප්‍රතිපදාව අනුමත කළ නමුත් ඔවුන් ඒ සඳහා දැක් වූ මාර්ගය ස්වකීය සම්ප්‍රදායේ අනන්‍යතාව හා බද්ධ කිරීම නිසාවෙන් අනෙක් බෞද්ධ සම්ප්‍රදායන්ගෙන් වෙනස් වන ආධ්‍යාත්ම මාර්ගයක් එහි දී නිර්දේශිත වේ. යෝගාචාර පරම සත්‍යය වන විඤ්ඤාණ සංකල්පය තුළින් විද්‍යාමාන හෝ අවිද්‍යාමාන සියලු ධර්මයෝ චිත්‍රමාත්‍රයක් පමණක් වන බව වටහා ගැනීම ඔවුන්ගේ තථතාව හෙවත් නිර්වාණාවබෝධය යි. සියලු බෞද්ධ සම්ප්‍රදායන්ට සාධාරණ වූ ෂට් ඉන්ද්‍රියන්හි ක්‍රියාත්මක වීමෙන් සංජානනය කරනු ලබන විෂය වස්තූන්ගේ තැම්පත් වීමෙන් සැදුම් ලද මනන විඤ්ඤාණය සහ එහි ක්‍රියාත්මක වීමෙන් ජනනය වන ආලය විඤ්ඤාණ නම් නව විඤ්ඤාණද්වයක් හඳුන්වා දෙන ලද යෝගාචාරීහු ඒවායේ අන්‍යෝන්‍යය ක්‍රියාකාරීත්වය නිසාවෙන් සැදුම් ලද් ද්‍වෛයිත ආවරණ ධර්මයන් මගින් ආර්ය මාර්ග යට බාධා පමුණුවන බවත් එහි වන පුද්ගල නෛරාත්මතාව සහ ධර්ම නෛරාත්මතාව හෙවත් ක්ලේෂාවරණ සහ ඤෙයයාවරණ ප්‍රහාණය කිරීමෙන් සර්වඥතාවයට පත් වන බව දක්වයි. මෙහි ක්ලේෂාවරණ ප්‍රහාණය කිරීම ථේරවාද ආදී ශ්‍රාවකයාන සම්ප්‍රදායන්හි අර්හත්වයට පත්වීම ලෙස දක්වන ලද මොවුන් ඤෙයයාවරණ ප්‍රහාණය කිරීම යනු බුද්ධත්ත්වාවබෝධය බව පෙන්වා දෙයි. පොදුවේ ශ්‍රාවකයාන සම්ප්‍රදායන් තුළ ද බෝධිසත්ත්ව ප්‍රතිපාදව දක්වා ඇති බැවින් මහානිකයෝ තම සම්ප්‍රදායේ අනන්‍යයතාවය තහවුරු කරනුයේ බෝධිසත්ත්වයානයෙන් සර්ව බීජ ප්‍රහාණය කොට ධර්මකාය සමඟ එක් වීමෙන් බුද්ධත්ත්වට පත්වීමේ යෝගචාර සම්ප්‍රදායාගත ස්ථාවරයෙන් බව දැක ගත හැකි ය.

**මුඛ්‍ය පදඃ** නිෂ්ඨා මාර්ගය, පංච මාර්ග, බෝධිසත්ත්වයානය, මහායාන චතුරාර්ය සත්‍යය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*Abhidharmakośa-Bhāṣya* of Vasubandhu - The Treasury of the Abhidharma and Its (Auto) Commentary. Volume 1, (2012). Translators:Lodrö Sangpo, Louis de La Vallée Poussin, Motilal Banarsidass Publishers.

Chong, Liew Jew (2009). *The Sarvāstivāda Doctrine of the Path of Spiritual Progress*. Author publication.

Conze, Edward (translator and editor). (1985). *The Large Sutra on Perfect Wisdom: With the Divisions of the Abhisamayālankāra*. University of California Press.

Dhammajothi, Kulala Lumpur, (2002). Sarvāstivāda Abhidharma. The Buddha-Dharma Centre of Hong Kong.

Robert E. Buswell, Donald S. Lopez, (2014) *The Princeton Dictionary of Buddhism*. Princeton University Press.